**ශ්‍රී ලංකා රෝල් බෝල් සම්මේලනය - 2022**

**------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. මතය ව්‍යාචනය**

ශ්‍රී ලංකා රෝල් බෝල් සම්මේලනයේ ("සම්මේලනය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ප්‍රකාශය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ආදායම් සහ වියදම් ප්‍රකාශය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මා හට නොහැකි විය. මෙම කරුණුවල ප්‍රතිඵලයක් ලෙස, වාර්තාගත කළ හෝ නොකළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ආදායම් සහ වියදම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ වල අගයන් සහ අයිතමයන් සම්බන්ධව කිසියම් ගැලපීමක් අවශ්‍ය වේද යන්න තීරණය කිරීමට මා හට නොහැකි විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. කෙසේවෙතත්, මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සම්මේලනයේ මුළු වගකීම් එහි මුළු වත්කම් රු. 5,031,855 කින් ඉක්මවයි. එසේම, සමාලෝචිත වර්ෂයේ සම්මේලනයේ මුළු වත්කම් හා සසඳා බලන විට, සමුච්චිත අරමුදලේ සෘණ ශේෂය 109 ගුණයක් විය. මෙයින් ඇඟවෙන්නේ, සම්මේලනය ඉදිරියට පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවයි. කෙසේ වෙතත්, විධායක කමිටුව මෙම තත්ත්වය සලකා බලා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීමට සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | සියලුම ණය ගෙවීම 2023 වර්ෂයේදී ආදායම් ලෙස පරිවර්තනය කිරීමට කටයුතු කර ඇත. | සම්මේලනයට අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳ පවතින සැලකිය යුතු අවිනිශ්චිතතාවය අවම කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 109,685 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 35,085 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 144,770 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රධාන හේතුව ලෙස සැලකෙන්නේ මුළු වියදම් රු. 337,230 කින් වැඩිවීමට සාපේක්ෂව මුළු ආදායම රු. 482,000 කින් ඉහළ යාමයි.

## 3. වගවීම සහ යහපාලනය

### 3.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සම්මේලනය 2022 වර්ෂය සඳහා අයවැය සකස් කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ සම්මේලනයේ මූල්‍ය පාලනය ඇගයීමට ලක් කළ නොහැකි විය. | ඉදිරි වසර සඳහා අයවැය සකස් කර විධායක කමිටුවේ අනුමැතිය සහිතව ඉදිරි වසරේ දි විගණනය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ඇත. | අදාල මූල්‍ය වර්ෂය ආරම්භ කිරීමට ප්‍රථම වාර්ෂික අයවැය සකස් කළ යුතුය. |

### 3.2 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 1990/23 ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (xii) වගන්තියට අනුව, ක්‍රියාකාරී සැලැස්ම මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට යවා නොතිබුණි. | ඉදිරි වසරේ දි ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ඇත. | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමාදයකින් තොරව අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ඇත. |

### 3.3 ආයතනික සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 1990/23 ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7(xi) වගන්තියට අනුව, සම්මේලනය විසින් ආයතනික සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරි වසරේ දි ආයතනික සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ඇත. | විධායක කමිටු හි අනුමැතිය සහිතව ආයතනික සැලැස්ම සකස් කර විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

### 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය සම්මේලනය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරි වසරේ දි ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ඇත. | මූල්‍ය වර්ෂය ආරම්භ වීමට ප්‍රථම ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |